මාධ්‍යයක් මගින් පුවත් වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී සෑමවිටම නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට සාධාරණ උත්සාහයක් ගත යුතු වේ. එසේම පුවතකට සිරස්තල යෙදීමේදීද සමාජයට නිවැරදි පණිවුඩයක් ලබාදෙන ආකාරයකින්, නිසි විචක්ෂණ භාවයකින් සිරස්තල යෙදිය යුතු නොවේදැයි පාඨක අප විමසිය යුතුයි. ඊට හේතුව, සමාජයේ අදහස් උදහස් හැඩගැස්වීමට පවා මාධ්‍ය මගින් යම් දායකත්වයක් ලැබීමයි.

ඉහත කරුණට උදාහරණ ලෙස, සිය බිරිඳ සමග වූ පෞද්ගලික ගැටළුවක් හේතුවෙන්, ඇයට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කළ සැමියෙකු සම්බන්ධ පුවතක්, මාධ්‍ය තුළ ආවරණය වී තිබූ ආකාරය දැක්විය හැක.

මෙය වාර්තා කරනා අරුණ (12/01) පුවත් සිරස්තලයේ සඳහන් වන්නේ "බිරිඳ යහමගට ගන්න තාප්පයකට මුවාවී සැමියා ඇසිඩ් ගහලා" යනුවෙනි.

1) ඔබ සිතනා ලෙසට මෙම සිරස්තලය ඔස්සේ එම අපරාධය සාධාරණීකරණය කිරීමක් සිදු නොවන්නේ ද?

2) ඒ ඔස්සේ, එවැනි අපරාධ සාමාන්‍යකරණය වීමට දායකත්වයක් නොලැබෙනු ඇතිද?

මෙම සිරස්තලය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?